
# දඟකාර ලේන් පැටවා



ෂෙනුලි රත්නායක

# දඟකාර ලේන් පැංචා

## සෙනුලි රත්නායක

# දඟකාර ලේන් පැංචා

සෙනුලි රත්නායක.

**2025.02.08**

978-624-208-396-4

# පිදුම

මෙම පොත මාගේ
දෙමව්පියන්ටත්, මට
නැණ නුවණ ලබාදෙන
ගුරුවරුන්ටත්
ආදරයෙන්, ගෞරවයෙන්
පුද කරමි!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක කාලෙක කැලෑවක ජීවත් වුණා නපුරු කොටි හාමි  කෙනෙක්. දවසක් කෑම කෑවට පස්සේ කොටියාට ගහක් යට හොඳටෝම නින්ද ගියා. මේක දැකපු පුංචි ලේන් පැටියෙක්ට හිතුනා කොටියාගේ වලිගයත් එක්ක සෙල්ලම් කරන්න.



ලේන් පැංචා නිදා සිටි කොටියාගේ ඇඟ උඩ ඉහළ පහළ දුවමින් සෙල්ලම් කරන්න පටන් ගත්තා. ඌ කොටියාගේ වලිගය උඩ නැගලා වලිගය දිගේ පහළට ලිස්සාගෙන ආවා.


z
zz
zz

මේක දැනුණු කොටියා මහා කෝපයෙන් කෑගහගෙන අවදි වුණා. ඌ පැනගන්න උත්සහ කලත් කොටියා ලේන් පැංචාව තද කරලා අල්ල ගත්තා. ලේන් පැංචා කොච්චර දැඟලුවත් ගැලවීමක් නම් ලැබුණේ නැහැ. කොටියා ඔහුගේ විශාල කට ඇරලා ලේන් පැංචාව ගිලින්න සූදානම් වුණා.



ලේන් පැංචා හොඳටෝම බය වුණා. "අනේ කරුණාකරලා මාව කන්න එපා. මේ වතාවේ විතරක් සමාවෙලා මට යන්න දෙන්න. මම කවදාවත් මේක අමතක කරන්නේ නැහැ. සමහර විට කවදාහරි මටත් පුළුවන් වෙයි ඔබතුමාට උදව් කරන්න" ලේන් පැංචා කිව්වා. කොටියා ටිකක් වෙලා කල්පනා කරලා ලේන් පැංචාගේ මේ අදහසට කැමති වුණා. ඔහු තදින් අල්ලාගෙන සිටි ලේන් පැංචාව අතහැරලා බිමින් තිබ්බා. "බොහෝම ස්තූතියි ඔබතුමාගේ මේ කාරුණික බව මම කවදාවත් අමතක කරන්නේ නැහැ." ලේන් පැංචා සතුටින් කිව්වා. "ඔබ බොහොම වාසනාවන්තයි ලේන් පැංචෝ මම කෑම කාලයි හිටියේ. ඒකයි මම ඔබට යන්න දෙන්නේ. ඒත් ආයෙ මාත් එක්ක සෙල්ලම් කරන්න ආවොත් මම උඹෙන් බඩ පුරව ගන්නවා" කොටියා කිව්වා.



ටික දවසකට පස්සේ කොටියා කැලෑවේ ඇවිදිමින් සිටියා. ටිකක් දුර යද්දී දඩයක්කාරයෝ අටවා තිබූ උගුලකට කොටියා හසුවුණා. කොටියා දැලට හසු වී තදින්ම හිරවුණා. කොටියා මහා හයියෙන් කෑ ගසමින් උගුලෙන් ගැලවෙන්න උත්සාහ කළා.



ලේන් පැංචා ඇතුළු කැලෑවේ සෑම සතෙකුටම මේ හඬ ඇසුණා. ඔහුට කරදරයක්! මම යන්න ඕන උදව් කරන්න ලේන් පැංචා හිතුවා. ලේන් පැංචා ඉක්මනින් කොටියා සිටින තැනට ගියා. "බයවෙන්න එපා ඔබතුමාව මම බේරගන්නම්". පුංචි ලේන් පැංචා උගුල උඩට නැග්ගා. ඌගේ පුංචි තියුණු දත්වලින් උගුලේ තදවුණු ලණු හපන්න පටන් ගත්තා. අන්තිමේදී ලේන් පැංචාට පුළුවන් වුණා කොටියාව උගුලෙන් බේරගන්න.



කොටියාට තේරුම් ගියා පුංචි ලේන් පැටියෙකුට වුණත් ලොකු දෙයක් කරන්න පුළුවන් කියලා. "ස්තූතියි ලේන් පැංචෝ මම ආයෙ කවදාවත් උඹට කරදරයක් කරන්නේ නැහැ. කැලෑවේ නිදහසේ සතුටින් ඉන්න.

ඕන වෙලාවක එන්න මාත්
එක්ක සෙල්ලම් කරන්න."
කොටියා සතුටින් කිව්වා.
මේක අහපු ලේන් පැංචා ඒ
වෙලේම කොටියාගේ ඇඟ
උඩ නගිමින් වලිගේ ඉහළ
පහළ ලිස්සමින් සෙල්ලම්
කළා.

ටික වේලාවකින් උගුලට හසුවූ කොටියා රැගෙන යන්න දඩයක්කාරයෝ කරත්තයකුත් අරගෙන එතැනට ආවා.කොටියා මේක දැකලා භයානක ලෙස ගොරවමින් ඔවුන් පසුපස එළවන්න පටන් ගත්තා. දඩයක්කාරයෝ හොඳටෝම බය වුණා. ඔවුන් හොඳටම බය වී ගම දෙසට දුවගෙන ගියා.


Grrr
Grr
Grr

කොටියා සහ ලේන් පැංචා මහා හඬින් හිනා වුණා. ඊට පස්සේ ඔවුන් දෙදෙනා හොඳම යහළුවන් විදියට කැලෑවේ සතුටින් ජීවත් වුණා.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්



978-624-208-396-4